ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 අප්‍රේල් 23 සඳුදා
04 වෙළුම - 26 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය

සාන්තුවර ජීවිත 07

කිතුනු උරුමය 08

කිතුනු පොතක් 11



## ශු. මාක් තුමා

මංගල්‍යය අප්‍රේල් 25 වැනිදා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# සුවිශේෂක ශුද්ධවර මාක් තුමා විසින් ලියා තිබෙන සුවිශේෂය ගැනයි.

## ආදරණීය දුවේ පුතේ...

අපි මේ දින වල සුවිශේෂී මංගල්‍යයක් පිළිබඳව කථා කරනවා. ඒ සුවිශේෂක ශුද්ධවර මාක් තුමාගේ මංගල්‍යයයි. එතුමා පේදුරු තුමාගේ අනුවාදකයා වශයෙන් පේදුරු තුමාගේ මතකයේ රැඳුන සටහන් ග්‍රන්ථාරූඪ කළ තැනැත්තායි. එතුමාණන් සුවිශේෂක කතුවරයෙක්. ශුද්ධවූ මාක් තුමාගේ සුභාරංචිය සුවිශේෂ පොත් හතරෙන් කුඩාම සුවිශේෂය හැටියට හඳුන්වනු ලබනවා. මෙම සුවිශේෂ ග්‍රන්ථය කුඩා සුවිශේෂ ග්‍රන්ථය වුවාට අද බයිබල් විමර්ශකයන් තුළ ඉමහත් උනන්දුවක් සහ සැලකිල්ලක් ලැබී ඇත්තේ ශු. මාක් සුභාරංචියටයි. එයටත් ප්‍රධාන වූ හේතු සාධකයක් තිබෙන බව ඔබ දැනගතයුතුයි. ඓතිහාසික වටිනාකම අතින් එය වැදගත් ස්ථානයක් දරන්නේ එය ඉතාමත් පැරණි සුවිශේෂය ලෙස අද පිළිගෙන ඇති නිසයි. ඒ අනුව මතෙව් සුවිශේෂය සහ ලූක් සුවිශේෂය ලියවෙන්නට මාක් සුවිශේෂය මූලික වශයෙන්ම හේතුකාරක වී ඇති බව සාක්ෂි ඇතිවම පෙනෙනවා.

ආදර දුවේ පුතේ,

ක්‍රි.ව: 140 පමණ ජීවත් වූ ''පපියස්'' නැමැති රදගුරු තුමාගේ ලිපියකින් මාක් සුවිශේෂය ගැන මුලින්ම දැන ගන්නට ලැබී තිබෙන බව බයිබල් විමර්ශකයන්ගේ අදහසයි. ''එව්සේබියස්ගේ'' ඉතිහාස සටහන් අතර මාක් සුවිශේෂය ගැන පළමු ලියවිල්ල සටහන්ව ඇති බව එයින් කරුණු ඇතිව පෙන්වා දී තිබෙනවා. ඒ සටහන මෙසේයි.

> ''මාක්, පේදුරු තුමාගේ අනුවාදකයා වශයෙන්, පේදුරු තුමාගේ මතකයේ සැටියට සමිඳුන් කළ කී දේ ලියා ගත්තේය. නමුත් ඔහු ලිවේ පිළිවලකට නොවේ. ඔහු සමිඳුන් ශ්‍රවණය කර නොතිබුණි. එතුමන්ගේ ශ්‍රාවකයෙක්ද නොවීය, නමුත් පේදුරු තුමා එම ඉගැන්වීම් තම අසන්නන්ගේ අවශ්‍යතා අනුව ඉදිරිපත් කළේය. මාක් ඉතා සැලකිල්ලෙන් හැකි තරම සටහන් කර ගත්තේය. ඒ සියල්ල සත්‍යවාදීව ඉදිරිපත් කළේය''.

ආදර දුවේ පුතේ,

මෙම 'පපියස්' රදගුරුතුමාගේ ලියවිල්ලේ මූලික අදහස වුයේ මාක් සුවිශේෂක වරයා පේදුරුතුමාට සවන් දී එයින් කරුණු ලබා ගත් බව පෙන්නුම් කිරීමයි. ඒ අනුව සත්‍ය කරුණු මත පදනම්ව සිදුවීම් ඒ අයුරින්ම එමෙන්ම විශ්වාසවන්තවත් ඉදිරිපත් කරන්නට මූලික වූ සුවිශේෂ කතුවරයා හැටියට ශු. මාක්තුමා හඳුන්වා දෙන්නට පිළිවන්.

අපේ සභා පියවරුන් හැටියට හා ශුද්ධ ලියැවිල්ල ව්‍යාප්තියේ පුරෝගාමීන් හැටියට නම් දරා සිටින ජස්ටීන්, අයිරිනියස්, ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් , ඔරිජන් සහ ජෙරොම් වැනි පියවරු ජේසුස් ස්වාමීන් වහන්සේ කළ කී දැ පිළිබඳව සඳහන් කරන ශු. මාක් සුවිශේෂය උතුම් බව හා සත්‍යමය ග්‍රන්ථයක් සේ පිළිගැනීමට මුල් වුවා. මුල් සභා පියවරුන්ගේ ලිපිවලින් පැවසෙන්නේ මාක් සුභාරංචිය දෙවැනි සියවසේ මුල සිටම පිළිගත් ග්‍රන්ථයක් බවයි.

ආදර දුවේ පුතේ,

රෝමයේ එවකට (ක්‍රි:ව: 55-65) කලයේදී තිබුණාවූ බිහිසුණු පීඩාකාරී තත්ත්වයනට එඩිතරව මුහුණ දෙන්නට, දිරි දීමක් වශයෙන් මාක් සුභාරංචි පොත ලියැවුණු බව අද පිළිගත් මතයයි. රෝමයේ නීරෝ අධිරාජයාගේ කාලයේ, මුල්ම කිතුනුවන් මුහුණ දුන් පීඩාකාරී ප්‍රාණ පරිත්‍යාගී යුගය එය බව සඳහන් වෙනවා. රෝමයේ සහ ජෙරුසලම ප්‍රදේශයේ එවකට තිබූ අර්බුදකාරී සහ පීඩාකාරී තත්ත්වයට ක්‍රිස්තු දර්ශනය මෙම සුවිශේෂයේ ඉදිරිපත් කර ඇති අතර ජනතාවගේ විශ්වාසය එමගින් තහවුරු කරන්නටත් එය මූලික වී තිබෙනවා.

මාක් තුමාගේ සුවිශේෂයේ පරමාර්ථ කිහිපයක්ද අපි හඳුනාගත යුතුයි.

- ⋆ පැවති අඳුරු යුගයේදී, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මුහුණදුන් සැබෑ දුෂ්කරතා හා පීඩා මතක් කර දෙමින් එම කිතුනුවන් දිරිමත් කිරීමට
- ⋆ පැවති දුර්මත බිඳ හෙලන්නටත් ඒ නිසාම සැබෑ ක්‍රිස්තු ජීවිතය එළි දක්වන්නට කටයුතු කිරීමට ......
- ⋆ ක්‍රිස්තු කථා පුවතේ සත්‍යතාවය ප්‍රචලිත කිරීමේ අභිලාෂය මුඳුන්පත් කිරීමට .....

ආදර දුවේ පුතේ,

අප්‍රේල් 25 දින මාක් තුමාගේ මංගල්‍යය සිහිපත් කරන අතරම දේව ආනුභාවයෙන් පිරි, මිනිස් අතින් ලියැවුණු මාක් සුභාරංචිය, අද සමාජයටත්, උතුම් දේව - මිනිස් පණිවිඩයක් හඬ නංවන බව අප මතකයේ තබාගත යුතුයි. ඔබත් ශු. මාක් සුභාරංචිය හොඳින් කියවා පරිශීලනය කිරීමට කුඩා කල පටන්ම උත්සුක විය යුතුය.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




# සැබෑ මිතුරියක්

නිලු ඔයා මොකද බොහොම දුකෙන් වගේ ඉන්නේ.ඔයා නිතරම මොනවාහරි කල්පනා කරනවා ඔයාට මොකුත් කරදරයක් තියෙනවාද ?

අලුත් පංතියට ඇවිත් දවස් දෙකයි ගත වුනේ නිලු මොකක් හරි කරදරයකින් ඉන්න බව තේරිලයි මං එයාගෙන් එහෙම ඇහැව්වේ. එයා එක වරම උත්තරයක් දුන්නෙ නැහැ. බලාගත් වනම හිටියා. මං ආයෙත් එයාගෙන් ඒ ප්‍රශ්නයම ඇහුව්වා.

''ඉන්දුකා ඔයා අහපු හින්දයි කියන්නේ. මං ඉන්නේ පුංචම්ම ළඟ. මට ටිකක් ගෙදරින් කරදර තියෙනවා. ඇත්තම කියනවා නම් මට හුඟාක් දවස් වලට උදේට කන්න ලැබෙන්නෙත් නෑ. ආණ්ඩු වෙන් හම්බවුන අච්චු පොත් ඇරුනම මට තියෙන්නේ එකම ඇක්සයිස් පොතයි. මට මේවා ගැන නිතරම කල්පනා වෙනවා. ....'' නිලු කියාගෙන යන අතරේ එයාගේ දෑස් කොනින් නැගුණ උනු කඳුළු කැට කීපයක් ගවුමට වැටිලා බොඳ වෙලා ගියා.

''නිලු ඔයාට වෙලා තියෙන දේ ගැන මට හරිම දුකයි.'' මම ඔයාගෙන් ඊට එහා මුකුත් ඇහුවේ නැත්තේ ඔයාට තවත් දුක හිතෙයි කියලයි.

එද පාසල හැරුණු හැටියෙ, මම ගෙදර දුව ආවේ අම්මට නිලු ගැන කියන්න හිතාගෙ නමයි. මම ඇඳුම් මාරු කරල කුස්සියට එනකොටම අම්මා බත් පිඟාන මගෙ අතට දුන්නා. බත් කන අතර මං නිලු ගැන ඔක්කොම විස්තර කිව්වා. අම්මත් නිලු ගැන හරියට දුක් වුනා. අම්මා ජේසුගේ ශුභාරංචිය නොමිලේ පතල කරන සංවිධානයක නොමිලේ වැඩ කරනවා.

''දුවේ අපි නිලුට පුළුවන් විදියට උදව් කරමු. මට ඔක්කෝටම වැඩිය දුක, උදේට කෑමකුත් නැතිව සමහර දට එනවා කිව්වාමයි. මං හැමදම ඔයාට ඉස්කෝලෙදි කන්න දෙන කෑම පංගුව වැඩියෙන් දෙන්නම් ඔයා නිලුටත් දීල බෙදගෙන කන්න. අපි නිලු වෙනුවෙන් යාච්ඤා කරමු. රෑට යාච්ඤා කරන වෙලාවට. '' අම්ම උනුවුනු හදවතකින් එහෙම කිව්වා.

එද ඉඳල මං පංතියේදී කෑම කද්දි නිලුටත් දීලා බෙදගෙනයි කෑවේ. අම්ම දවසක් පංතියෙ ටීචර්වත් මුණ ගැහිලා නිලු ගැන කතා කළා. නිලුට දෙන්න කියලා ඇක්සයිස් පොත් 3 කුත් දුන්නා. නිලු ගැන හොයලා බලන බව ටීචර් අම්මට කියලා තිබුණා.

''ඉන්දුකා, ඔයා වගෙ මිතුරියක් මට මුණගැහුනු එක මට ලොකු සැනසීමක්. මට ඉගෙන ගන්න හරිම ආසයි. දැන් මට පොතුත් තියෙනවා. ටීචර් ලොකු සර්ට කියලා මට තවත් පොත් වගයක් අරගෙන දුන්නා. ඒ පොත් දුප්පත් අයට දෙන සමිතියකින් දෙන ඒවා. ගෙදරින් මට සුළු සුළු කරදර තිබුණත් මා දැන් ඒවා වැඩිය ගණන් ගන්නේ නෑ. ඔයාලා මං ගැන ජේසුට යාච්ඤා කරනවා කිව්වා නේද? මට හිතෙනවා මට දැන් ඒ පිහිට ලැබෙනවා කියලා. මමත් රෑට තනියම ජේසුට යාච්ඤා කරනවා.

''නිලු ඔයා සතුටින් ඉන්නවා දැකීම මට හරිම සතුටක් ..... ඔයාට දැන් දුක් කඳුළු අතරින් හිනැහෙන්න පුළුවන්..... '' කිවූ මම විවේකයට සීනුව වැදෙද්දිම නිලුවත් අතින් අල්ලගෙන සෙල්ලම් කරන්න පිට්ටනියට දිව්වේ හිතේ සන්තෝෂය පුරවාගෙන.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි.**



කඩලාන ශා. අන්තෝනි විදුහලේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය පසුගිය ද කඩලාන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මෙය ආචාර්ය මණ්ඩලය එක්ව සංවිධානය කෙරිනි. මෙදින අවස්ථාවක් ඡායාරූපයේ දැක්වේ.

(සුරත් ද සිල්වා)

## ළ.ක්‍රි.වී සුහද හමුවක්.

යටියන ශු. මිකායෙල් අග්‍රදූතතුමන්ගේ දෙව් මැදුරේදී පසුගියද ළ.ක්‍රි.වී සමාජය විසින් සුහද හමුවක් සංවිධානය කළහ. මෙහිදි කොළඹ අගරද ගුරු පදවි ළක්‍රිවි සහයක උපාධ්‍ය ගරු සුසිත් රන්දිල් නි.ම.නි. පියතුමාගේ ප්‍රධානත්වයෙන් ළ.ක්‍රි.වී සමාජයේ ළමුන් සඳහා නිල ලාංජන ලබාදුනි.

මෙයට යටියන මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් මදුරාවල පියතුමා ඇතුළු පැවිදි සොහොයුරියන්ද යටියන හා බල්ලපාන ඒකකයේ දරුවන් ඇතුළු දෙමාපියෝද සහභාගී වූහ.

**විශ්මා ප්‍රින්ජලී**
**යටියන**



තල්ගහපිටිය මීසමට අයත් කරව්වැව ආරෝග්‍ය දේවස්ථානයේ දහම් පාසලේ ළමෝ 11 දෙනකු පසුගිය ද ප්‍රථම වරට දිවබොදුන් ලබාගත්හ. එම ළමුන් පුහුණු කළ දහම් ගුරුවරුන් සමඟ මීසම් සේවක ගරු ඇන්ඩෲ පොන්සේකා, මීසම් සහයක ගරු ගෝමි දිවාකර පියතුමන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. - කේ.ඩී. පයස්







## ඔබේ සමිතිය ගැන අපිට ලියා එවන්න.

ඔබ පාසලේ, දහම් පාසලේ ඇති ළමා සමිති සමාගම් පිළිබඳව තොරතුරු පළ කිරීම සඳහා එම සමිතියේ තොරතුරු, නිලධාරි මඬුල්ලේ නම් ගම් ද ඇතුළත් කොට සමුහ සේයාරුවක් සමඟින් විස්තර
"අපේ සමිතිය", ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.
යන ලිපිනය වෙත යොමු කරන්න.

## මාසික සිතිවිල්ල

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



**මාසික සිතිවිල්ල**
"අප්‍රේල් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## මරණය ජයගත් ජේසු සමිඳාණෝ



**දිල්ශාන් සම්පත් ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල
මහවිදිය මීසම



**සහන් මධුෂ ප්‍රනාන්දු**
09 ශ්‍රේණිය
සාන්ත ඇන්ඩෲ මධ්‍ය විදුහල
පුත්තලම

## දයාබර මවුනි



සතුට සොම්නස උරුම වූ
මේ ජීවන ගමනේ
මා ලද එකම සොම්නස ද
එකම ප්‍රාණය ද....
මෙතෙක් මා ලද සියල්ල අතරේ
දෙවි සමිඳුන් මා හට ලැබ දුන්
උත්තරීතර තිළිනය ඔබයි...
අපරිමිත මවු සෙනෙහස තුළ කිමිදෙමින්
මගේ දිවිය ඒකාලෝක කරන
මිණි පහන ඔබයි
දයාබර මවුනි...

**එච්. ඇන් දිනේෂිකා පෙරේරා**
12 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ

# ඔබගේ ජීවිත වඩාත් ස්වාමින් වහන්සේට සම්බන්ධ කර ගන්න

## කොළඹ දකුණු කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණි පියතුමන් මොරටුවේ එකමුතු ළමා හමුවේදී පවසයි.

මොරටුවේ සියලු කිතුනු සභාවන්වල දරු දැරියන් වශයෙන් එකට එක් වී සිටින මේ මොහොතේ අපට දැනෙන එක් දෙයක් තියෙනවා. ඒ තමයි අපි හැමෝම ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරන කිතුනු අනුගාමිකයන් කියන හැඟීම. උන්වහන්සේව අනුගමනය කරන සියලු සභාවන් වල අනාගතය ඔබයි. අද දින ඔබ මේ ලෙස එකට එකතු වී සිටිම අප හැම දෙනාටම ලොකු ප්‍රීතියක්,





ලොකු ධෛර්යක් , ලොකු ශක්තියක් වන බව කොළඹ දකුණු කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණි ප්‍රනාන්දු පියතුමන් ප්‍රකාශ කළේ කතෝලික, ක්‍රිස්තියානි, බැප්ටිස්, එංගලන්ත, හා ගැලවීමේ හමුදා වල දරු දැරියන් එක් රැස්වී මොරටුව වේල්ස් කුමර විදුහල් ක්‍රීඩාංගණයේ පැවති එකමුතු ළමා හමුවකදීය.

සියලුම නිකායන්ට අයත් දරු දැරියන් ගොබ් කොල රැගෙන තම තමන්ගේ දහම් පාසල් වල දේවස්ථානවල තූර්යවාදක කණ්ඩායම් පෙරටු කර ගනිමින් එම සභාවල දේවස්ථාන වලින් පිටත්වී අලංකාර පෙරහරේ පැමිණ වේල්ස් කුමර විදුහල් ක්‍රීඩාංගණයට එක් වුහ.

එහිදී වැඩි දුරටත් රැස්ව සිටි දරු දැරියන් ඇමතු අතිගරු සිරිල් ගාමිනී පියතුමා කියා සිටියේ කුඩා දරු දැරියන් වන ඔබ වඩ වඩාත් යාච්ඤා කරන්නත්, වඩා වඩාත් ශු. ලියවිල්ල කියවා මෙනෙහි කරන්නත්, නිතර නිතර මර්ධන ක්‍රියා කර ඔබේ ජීවිත වඩ වඩාත් ස්වාමින් වහන්සේට සම්බන්ධ කර ගන්නත් අදිටන් කර ගන්නා ලෙසත්ය.

මෙම අවස්ථාවට විවිධ නිකායන් වලට අයත් ආගමික නායකයන් දහම් ගුරු මහත්ම මහත්මීන් රැසක් එක්වී සිටියහ.

**සේයා හා සටහන :**
**සුමිත් මාර්ක් ද සිල්වා**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**01. උත්පත්ති පොතේ පළමු මැවීමේ කථාව සහ දෙවන මැවීමේ කථාවේ දක්නට ලැබෙන ලක්ෂණ කවරේ ද?**

| පළමු මැවීමේ කථාව | දෙවන මැවීමේ කථාව |
|---|---|
| • පූජක සම්ප්‍රදාය ( P ) මත ගොඩනැගුණ මැවීවේ පළමු කථාවට අනුව දෙවියන් වහන්සේ තම ස්වරූපයට හා සමානකමට අනුව මිනිසා මැවූ සේක.<br>• මිනිසා මවා ඇත්තේ හයවන දවසේදීය.<br>• මනුෂ්‍යයා මවා ඇත්තේ ඔහුට ජීවත්වීමට අවශ්‍ය භෞතික පරිසරය සකස් කළ පසුවය.<br>• දේව සමානකමට මවන ලද මිනිසා උතුම්ම මැවිල්ල වේ.<br>• මිනිසා ශ්‍රේෂ්ඨතම මැවිල්ල නිසා අනෙකුත් සියලු මැවිලි පාලනය කරයි. එනම්, භෞතික ලෝකයේ පූර්ණ ආධිපත්‍ය දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට පවරාදුන් සේක.<br>• දෙවියන් වහන්සේ මැවිමේ කාර්යය දින 06 කින් නිමකර සත්වන දිනයට ආසිරි පතා එය ශුද්ධ දවසක් ලෙසට වෙන්කර වදාළ සේක. | • මැවීමේ කථා පුවත යාවිස්ත ( යාවේ - J) සම්ප්‍රදායට අයිති වුවකි.<br>• දෙවියන් වහන්සේ පොළවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ජීවන හුස්ම දී ඔහු ජීවමාන කළ සේක.<br>• මනුෂ්‍යයාදූවිල්ලෙන්නිර්මාණයවූනිසාභෞතිකලෝකයට අයිතිය. එසේ වුව ද, දෙවියන් වහන්සේ මනුෂ්‍යයාගේ නාස්පුඩු තුළට හෙළූ ජීවන හුස්ම, භෞතික ලෝකයට අයිති නොවුවකි. එය දෙවියන් වහන්සේට අයිති ආධ්‍යාත්මික දෙයකි.<br>• එබැවින් මිනිසා තුළ භෞතික මෙන්ම ආධ්‍යාත්මික ශරීරයක් තිබේ.<br>• මැවීමේ කථා පුවත දින හතකින් යුක්ත නොවේ. |

**03. දෙවියන් වහන්සේ දකිනට අප තුළ තිබිය යුතු සුදුසුකම් මොනවාද?**

★ මනුෂ්‍යයා තුළ ඇති ආත්මය හෙවත් ස්ප්‍රීතුව. ★ දේව සමානාත්මතාවය ★ හෘද සාක්ෂිය

**04. ''මනුෂ්‍යයා මෙලොව ජිවිතයේ මෙන්ම මතු ජීවිතයෙහි සතුටින් ජීවත් වීම දෙවියන් වහන්සේට ප්‍රශංසාවකි''. මෙසේ පැවසුයේ කව්ද?**

★ සාන්ත ඉරේනියස් තුමා (අයිරේනියස් තුමා)

**05. ස්වාභාවික ශරීරය සහ ආධ්‍යාත්මික ශරීරය පිළිබඳව 1 කොරින්ති 15/44-49 සඳහන් කරුණු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්න.**

**06. නිවැරදි හෘද සාක්ෂිය යනු කුමක් ද?**

★ යහපත සහ අයහපත පිළිබඳව දෙවියන් වහන්සේ විසින් මිනිස් හදවතේ ලියන ලද නීතියයි.

| ස්වාභාවික ශරීරය | ආධ්‍යාත්මික ශරීරය |
|---|---|
| • වළලනු ලබන්නේ ස්වාභාවික ශරීරයකි. | • උත්ථානු කරනු ලබන්නේ ආධ්‍යාත්මික ශරීරයකි. |
| • පළමු ව පැමිණෙන්නේ ස්වාභාවික දේය. | • දෙවනුව පැමිණෙන්නේ ආධ්‍යාත්මික දේය. |
| • පළමු මිනිසා භූමියෙන්ය . ඔහු භෞමිකය. | • දෙවෙනි මිනිසා ස්වර්ගයෙහි, ඔහු ස්වර්ගීකය |
| මිනිස් අපි භෞමික තැනැත්තාගේ ස්වරූපය දරන්නා සේම, ස්වර්ගීක තැනැත්තාගේ ස්වරූපය දරමු. | |

**ඉදිරිපත් කිරීම ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

ඉතිරිය ලබන සතියේ .....



# ශු. මාර්ටින් ද පොරස් මුනිතුමා.

ගම :- ලීමා නුවර , පේරු උපත :- 1579 දෙසැම්බර් 09

මව හා පියා :- පියා ස්පාඤ්ඤද කෙනෙකි,

මව පැනමාව ගෝත්‍රික නිවහල් වු කෙනෙකි.

මරණය :- 1639 නොවැ. 03

මංගල්‍ය දිනය :- නොවැ. 03

ශුද්ධවරයට එසවීම :- 1962 මැයි 06 වන දින 23 වන ජුවාම් පාප් තුමන් විසිනි.

නාම සාන්තුවරයා - බාබර් ( කොණ්ඩේ කපන අය )



## සාන්තුවර ජීවිත

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

### ජීවිතයේ සුවිශේෂි තැන්

දොමිනිකා නුනිකායේ ගිහි පැවැදි වරයකු වු මාර්ටින් තම ජීවිත කාලය විවිධ අය වෙනුවෙන් වැය කළා. බාබර්වරු, ගොවි කම් කරුවන් , දානමය කටයුතු වල වැඩ කරන්නන් සහ රෝගින්ව බලාගන්නන් මේ අතර ප්‍රධානය.

හෙතෙම විදේශිය ධර්මදූත වරයකු වීමටත් ප්‍රාණපරිත්‍යාගිවරයකු වීමටත් දැඩි ආශාවක් තිබුනේය. එය ඉටු නොවු හෙයින් විවිධ මර්දන ක්‍රියාවන් හා උපවාස වල යෙදෙමින් තම සිරුරින් ප්‍රාණපරිත්‍යාගිවරයකු විය. ඔහු තුළ සුවිශේෂි ගුණාංග සමුදයක් තිබුනේය. ඔහු සැමට ආදරය කළේය.

සතුන්ට මිනිසුන්ට මෙන්ම කරුණාව දැක්වුයේය. තම සහෝදරියගේ නිවසේ ඔහු විසින් සත්ව රෝහලක් විශේෂ යෙන් සුනඛයන් පවත්වාගෙන යන ලදී. ඔහුගේ අධ්‍යාත්මික ප්‍රඥාව ඉතා ඉහල මට්ටමක විය. දේවධාර්මික ගැටලු විසඳීමට ද හෙතෙම ඉදිරිපත් වු අවස්ථා ඇත.

ඔහු කළ විවිධ වැඩ අතරේ දිළිඳුන්ට ප්‍රමුඛත්වයක් ලබා දුන්නේය. අනාථයන් වෙනුවෙන් නිවාසයක් හා ළමුන් වෙනුවෙන් රෝහලක් ද ඉදිකරන ලදි. ඔහුගේ ශුද්ධ වු හා කැප වු ජීවිත පැවැත්ම තුළ විවිධ ප්‍රතිහාර්යයන් තුවාල සුවකිරීම් , මිනිසුන් හා සතුන් සමග සැබැඳියාවක් ඇති කරගත්තේය. එකවර ස්ථාන 2 ක වැඩසිටීමේ හා භාවනාත්මකව වායු ගෝලයේ රැඳී සිටී මටද ඔහුට බලයක් තිබිණි.

ඔහුට ජුවානා නමින් එක් සහෝදරියක් විය. දිළිඳුකම තුළ තම ජීවිතය ගොඩ නගා ගත්තද මාර්ටින් තම උත්සාහයෙන් ඉගෙන ගත්තේය.

තමා ගිය දොමිනිකානු පාසලේ ඇති වු ණය අර්බුදයකදී ඔහු ඉදිරිපත් වී එය පියවා දැමීමට කඩිනමින් ක්‍රියා කළේය.

### ජීවිතයට පාඩම්.

- ඔබේ දිළිඳුකම ගැන දුක් නොවන්න. හෙට දවස වෙනුවෙන් කම්මැලි නොවී උත්සහ වන්ත වන්න.
- ඔබේ යහලු යෙහෙළියන්ට උපරිමයෙන් ආදරය කරන්න.
- සතුන්ට ආදරය කරන්න. කරුණාව දක්වන්න.
- නිතර යාච්ඤාවට ඉඩ දෙන්න. එවිට ඔබටත් දේව බලය ලැබෙනු ඇත.
- පවුලේ අසීරු අවස්ථා වලදී පුංචි ඔබට හැකි අයුරින් උදව් කරන්න.



# අති උතුම් සෙ
# සසුනිසුරාණෝ
# 85 විය පසු ක

විශ්ව කතෝලික සභා වීරාවලියේ 265 වැනි සසුනිසුරාණන් ලෙස 2005 අප්‍රේල් 19 වැනිද පත්වූ අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා අප්‍රේල් 16 වැනිද 85 වැනි විය සපුරාලීය.

1927 අප්‍රේල් 16 වැනිද දකුණු ජර්මනියේ බැවේරියාවේ මැක්ටල් ඇම් ඉන්හිදී උපත ලැබීය. පහළ බැවේරියාවේ පාරම්පරික ගොවි පවුලකින් පැවත ආ වෘත්තියෙන් පොලිස් නිළදරුවකු එතුමාගේ පියා විය. මව ගෘහනියක විය 1946 සිට මියුනිච් සරසවියෙන් දේවධර්මය හැදෑරා ජෝශප් රැට්සිංගර් හිමි 1951 ජුනි 29 වැනිද පූජක වරම් ලැබීය. දෙවන ලෝක යුද සමයේ හිට්ලර්ගේ නාසි හමුදාවේ අනිවාර්ය යුද සේවයේ නියැලි එතුමා පූජකවරය ලබා ගැනීමෙන් පසු ගුරු වෘත්තියට නැඹුරු විය.

1953 දී ආචාර්ය උපාධිය දිනාගත් උන්වහන්සේ ඉන් සිවු වසරකට පසු සරසවි ආචාර්ය මණ්ඩලයට එක් විය. ධර්මයේ මූලික න්‍යායන් හා මූලික දේවධර්මය මෙන්ම දර්ශනය පිළිබඳ උසස් විද්‍යාලයේද , ප්‍රේසිං විද්‍යායතනයේද දේවධර්මය ඉගැන්විය. 1959 සිට 1969 දක්වා බොන් නුවරද, 1963 සිට 1966 දක්වා මුන්ස්ටර් හිද, 1966 සිට 1969 දක්වා ටියුබින්ගාවලද ඉගැන්වීමේ නියැලුනු උන්වහන්සේ 1969 සිට රෙජන්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ මේ විෂයයන් පිළිබඳ මහාචාර්ය ධුරය දරන අතරේම එම සරසවියේ උප සභාපති ධුරයේද කටයුතු කළේය.

ගරු ජෝශප් රැට්සිංගර් පියතුමා වියත් දේව ධර්මාචාර්ය වරයකු ලෙස පතළ වෙමින් සිටි සමයේදී ම 1962 දී දෙවන වතිකාන කතිකාවත ආරම්භ විය. ලොව පුරා ප්‍රකටව සිටි ජර්මනියේ කොලොන් අගරදගුරු අති උතුම් ජෝශප් කාදිනල් ප්‍රින්ස් හිමිපාණන්ගේ උපදේශකයකු ලෙස එක්විය. 1968 දී ගරු ජෝශප් රැට්සිංගර් පියතුමා ලියූ ක්‍රිස්තියානිය පිළිබඳ හැඳින්වීමක් ග්‍රන්ථය මගින් සරසවි කථිකාචාර්ය ධුරයේ උපයෝගි කරගත් පාඩම් හා සිය වෘත්තියෙන් ලත් විශ්වාසයේ අපෝස්තලික භාවය ප්‍රකාශයට පත් කළේය. 1973 දී දූතික සේවාවට කැපවීම අරබයා ලිපි ලේඛන, දේශන, දහම හා දර්ශනය පදනම් කරගෙන ග්‍රන්ථයක් සම්පාදනය කළේය.

1977 මාර්තු මසදී අති උතුම් සවැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් අති උතුම් ජෝශප් රැට්සිංගර් හිමිපාණන්ව මියුනිච් හා ප්‍රේසිං හි අගරදගුරු හිමිපාණන් ලෙස පත් කරන ලද අතර 1977 මැයි 28 වැනිද අගරදගුරු ධුරයේ අබිසෙස් ගැන්වූයේ බැවේරියාන වසමේ වසර 80 කට පසු පත්වූ පදවි පූජක එඬේරාණන් ලෙසිනි. 1977 ජුනි 27 වැනිද අතිඅතුම් සවැනි පාවුළු සසුන් පියාණන් විසින් අති උතුම් ජෝශප් රැට්සිංගර් අගරදගුරු හිමිපාණන්ව කාදිනල්වරයට ඔසොවන ලදී. 1981 නොවැම්බර් 25 වැනිද අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් අති උතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් කාදිනල් හිමිපාණන්ව විශ්වාස වර්ධන සංගමයේ අධිපතිද , බයිබල් කොමිසමේ හා ජාත්‍යන්තර දේවධාර්මික කොමිසමේ සභාපති ලෙසද පත්කරනු ලද්දේ 1980



අති උතුම්

කිතුනු උරුමය

# ාළොස්වන බෙනඩික්

# රති

**සසුන් පිය පදවි ප්‍රාප්තියට 8 වසරයි**



ම් සොළොස්වන බෙනඩික් සසුනිසුරාණෝ රවුම තුළ මව, පියා සොහොයුරිය සහ සොහොයුරා සමඟ..

දී පැවැති විශ්ව රදගුරු සංසදයේ පස්වන මහා සභා වාරයේ සම්බන්ධීකරණ කටයුතු බාරව ඉටුකළ සුවිශේෂී මෙහෙවරද සැලකිල්ලට ගෙන විය හැකිය. 1983 දී මුළුදුන් සවැනි විශ්ව රදගුරු සංසද රැස්වීමේ සභාපති ලෙස අතිඋතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණෝ කටයුතු කළහ.

1998 නොවැම්බර් 06 වැනිදා පැවැති ලෝක කාදිනල් පිය හමුවේ උපනායක ලෙස පත්වූ එතුමාගේ පත්වීම 2002 නොවැම්බර් 30 ද අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා අනුමත කළේ ලොව කාදිනල් හිමිපාණන්ගේ ඉල්ලීමකට අනුවය. ඒ අනුව ලෝක කාදිනල් පිය හමුවේ නායකත්වයට උන්වහන්සේ පත්වූහ.

1986 කතෝලික සභාවේ නව ධර්මෝපදේශ කොමිසමේ සභාපතිත්වයට පත්වූ උන්වහන්සේ පුරා සය වසරක් අනලස්ව කටයුතු කිරීමෙන්, පසු 1992 දී කතෝලික සභාවේ නව ධර්මෝපදේශය සසුන් පියා වෙත පිළිගැන්වූහ. 1999 නොවැම්බර් 10 වැනිදා සසුන් නීතිය පිළිබඳ ගෞරව ආචාර්ය උපාධිය සාන්ත මරියා සරසවියෙන් පිරිනැමූ අතර 2000 නොවැම්බර් 13 ද වතිකානයේ විද්‍යා ඇකඩමියේ ගරු සාමාජිකත්වයට පත් කැර ගැනිණ. අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා සගසුව දිනීමෙන් පසු මීළගට පත්වන සසුන් පියා ලෙස වැඩි දෙනකු අතර පිළිගැනීමට පාත්‍රව සිටියේය.

එතුමන් සසුන් පිය පදවියට පත්වූ අතර තෙවන ජුවාම් පාවුළු යන නම වෙනුවට සොළොස්වන බෙනඩික් නම තෝරා ගැනීම බොහෝ දෙනාගේ කුහුලට හේතුවී තිබිණ. පළමු ලෝක මහා සංග්‍රාම සමයේ සසුන් පිය පදවිය දැරූ අති උතුම් පසළොස්වන බෙනඩික් සසුන් පියා ගතානුගතික සම්ප්‍රදායි හා නව අදහස් දරන දෙපිරිසක් අතර පැවති වාද භේද තුරන් කර පෙරදිග ඕතඩොක්ස් සභා හා සමගි සම්පන්න වීමට මහත් උත්සාහයක් දැරූ තැනැත්තකු ලෙස අතීතයේ ප්‍රකටව පැවැතිණ.

අතිඋතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන්ද සොළොස්වන බෙනඩික් ලෙස සිය නම තෝරාගත්තේද ආගමික සමගිය හා වෙන්වූ කිතුනු කණ්ඩායම් හා යළි සමගි සම්පන්න වීමේ අරමුණ පෙරදැරි කරගෙන බැව් එතුමන්ගේ ගෙවීගිය සත් වසරක කාල සීමාව පුරා දක්නට ලැබිණ. එමෙන්ම ශුද්ධවූ සභාවේ ඉපැරණි වටිනාකම් වන්දනාවේ ගරුත්වය හා බිඳ වැටෙන ආගමික වටිනාකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහිලා දැක්වෙන වෙසෙස් ලැදියාව මෙහිදී කැපී පෙනේ. ඉකුත් ද කියුබානු සංචාරයේ දී එරට කතෝලික ජනතාවට මහ සිකුරාද නිවාඩුව නැවත ලබාදීමට එතුමා සමත්වූයේ වසර හැට ගණනකට පසුවය. එතුමන්ගේ වැඩිමහල් සොයුරු අතිගරු ජෝර්ජ් රැට්සිංගර් මාහිමිපාණෝ ''මගේ සහෝදරයා පාප් තුමා ''මැයෙන් ග්‍රන්ථයක් රචනා කළහ.

සසුන් පිය පදවියට පත්වීමෙන් පසුද ග්‍රන්ථ කරණය අත් නොහළ අති උතුම් සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඒ මග ඉදිරියටම යමින් සිටී. සසුන් පියාණන් දිගුකල් දිනේවා !

**ශිරාන් මෛත්‍රී**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 50**

<u>අභ්‍යාසය</u>

**both / either හෝ neither යොදා සම්පූර්ණ කරන්න.**

1. Do you want tea or coffee?
ඔබ කැමති තේ ද කෝපි ද?
I don't mind ....... මට කෝකත් හොඳයි.
"don't mind" කියන්නෙ "කමක් නැහැ" කියන අදහස.

2. What day is it today? Monday or Tuesday?
අද දවස කවදද? සඳුද ද? අඟහරුවාදා ද?........................ . Today is Wednesday. ඒ එකක්වත් නෙමේ. අද අඟහරුවාදා.

3. What shall I eat? Bread or rice?
ඔබ මොනවද කන්නෙ? පාන් ද බත් ද ? Take ............... . දෙකෙන් ඕන එකක් කන්න.

4. Whom did you meet yesterday? Kamani or Rani?
කව්ද? ඔබට ඊයෙ මුණුගැහුනෙ? කමණිවද රාණිවද?
I met .......... . මට දෙන්නවම මුණගැහුණා.

5. When shall I phone you? Morning or evening?
මම කොයිවෙලාවෙද? ඔයාට ෆෝන් කරන්නෙ. උදේ ද? හවස ද? .............. . you can call me anytime.
ඕන එකක්. ඕන වෙලාවක මට කතා කරන්න.

6. Where is your father? Is he at work or home?
කෝ ඔබේ තාත්තා? වැඩට ගිහින්ද ගෙදරද? .................. . He has gone to Colombo. ඒ එකක්වත් නෙමේ. එයා කොළඹ ගිහින්.

**both / neither / either යන වචන සමඟ අවශ්‍ය නම් පමණක් of ද යොදා හිස්තැන් පුරවන්න.**

7. ................ my brothers are studying.
මගෙ සොහොයුරෝ දෙන්නම ඉගෙනගන්නවා.

8. You can take a bus, or you can go by train.
ඔබට බස් එකේ යන්න පුළුවන්. නැත්නම් දුම්රියෙ යන්නත් පුළුවන්. You can go ................ way.

9. I tried to call you twice. But ................ times you were out.
මම දෙපාරක් ඔබට කතාකරන්න උත්සාහ කළා. ඒත් දෙපාරම ඔබ හිටියෙ නෑ.

10. He has two sisters. But .............. them is studying.
ඔහුට සොහොයුරියන් දෙන්නෙක් ඉන්නවා. ඒත් එක්කෙනෙක්වත් ඉගෙන ගන්නෙ නෑ.

11. There was an accident. Two cars have collided. But ........... neither driver was injured. But 12. ................. cars were damaged. අනතුරක් සිදුවී තිබුනා. කාර් දෙකක් හැප්පිලා. රියදුරන් කාටවත් තුවාල නෑ. ඒත් කාර් දෙකටම අලාභහානි වෙලා.

13. I have two brothers. ................ them are studying.
මට සහෝදරයො දෙන්නෙක් ඉන්නවා. දෙන්නම ඉගෙන ගන්නවා.

**Both of us/ them, Either of us/ them, Neither of us / them යොදන්න.**

14. I asked two people the way to the station. But ............ knew.
මම දුම්රිය පළට යන පාර දෙන්නෙකුගෙන් ඇහැව්වා. එක්කෙනෙක්වත් දැනගෙන හිටියෙ නෑ.

15. I was invited to two parties but I didn't go to ...............
පාටි දෙකකට මට ආරාධනා තිබුණා. ඒත් මම එකකටවත් ගියේ නෑ.

16. There were two windows in the room. I opened .....................
කාමරේ ජනෙල් දෙකක් තිබුණා. මම දෙකම ඇරියා.

17. Sunil and I play tennis. But .......... can play very well.
සුනිලුයි මමයි ටෙනිස් ගහනවා. ඒත් අපි දෙන්නගෙන් එක්කෙනෙක්වත් හොඳට ක්‍රීඩා කරන්න දන්නෑ.

18. I tried two bookshops for a novel. But ................. had it.
මම නවකතාවක් ගන්න පොත් සාප්පු දෙකක බැලුව. එකකවත් තිබුණෙ නෑ.

**neither / either / none / any. යොදා සම්පූර්ණ කරන්න.**

19. I bought five books but didn't read............ of them.

20. I bought two books but didn't read .................. of them.

කිතුනු පොතක්

ඔබත් සොයාගෙන කියවන්න

# ලේ සහ මිදි යුෂ

**කර්තා - කේ ප්‍රැන්සිස් මහතා**




සග සුව දිනු ප්‍රකට කතෝලික ලේඛකයකු වන කේ. ප්‍රැන්සිස් ශූරීන් විසින් රචනා කරන ලද පත පොත අතර ලේ සහ මිදි යුෂ ජනප්‍රිය නවකතාවකි. ක්‍රිස්තු චරිතය පාදක කර ගනිමින් එය වඩ වඩාත් රස ගන්වමින් හා හර ගන්වමින් වියත් බවින් යුතුව ඉදිරිපත් කිරීමට ඇතැමෙක් සමත් වෙති.

ග්‍රන්ථයේ පෙර වදනේ මෙසේ දැක්වේ.

මෙකී අය හුදෙක් ශුද්ධ ලියැවිල්ලේ ඇති කරුණු ම විස්තර නො කරන නමුත් ඒවා පදනම් කොට ගෙන එයට අනුකූලව චරිත ගොඩ නගති. මෙහි දී ගත්කරුගේනිර්මාණශක්තිය අනුව කතාව රසවත් කිරීම සඳහා මනංකල්පිත සිද්ධීන්, චරිතයන් යනාදිය එයට එකතු කැර දක්වයි.

මෙසේ කතාවට එකතු කරනු ලබන අමතර කොටස් ඓතිහාසික සත්‍යයන් නොවන බව පැහැදිලි ය. එහෙත් මෙයින් ප්‍රධාන චරිතය හෙවත් ක්‍රිස්තු චරිතය තව තවත් කියවන්නා ගේ ගෞරවාදරයට පාත්‍ර වනවා මිස අගෞරවයට ලක් නො වන බව කිව යුතුයි.

කතාව පුළුල් කරනු වස් ඇතුළත් කරනු ලබන කොටස් ශුද්ධ ලියැවිල්ලෙන් ම නොවන නමුත් ඒවා ක්‍රිස්තු චරිතය පිළිබඳ ශුද්ධ ලියැවිල්ලේ ඉදිරිපත් වන චරිත ලක්ෂණ හුවා දක්වන්නට පොහොසත් වන්නේ ය.

''ලේ සහ මිදියුෂ '' යන මේ ගත ද සවිස්තරවැ ඉහත දක්වූ පොත් අතරට එක්වන්නේ ය. යුද සෙබළා සටන්කාමී දිවි පෙවෙත ගෙවන අතර කිතු සමිඳුන් ගේ ගෝලයන් සමඟ කුළුපග වැ ඇසුරු කිරීමේ වාසනාව හිමි කැර ගන්නේ ය. සමිඳුන් ද දැන හැඳින ගැනීමේ මහිමය ඔහු ලබාගත් සැටි මෙහි විස්තර කෙරේ.

ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා යුද සෙබළකුගේ සටන්කාමී දිවි පෙවෙත ඔස්සේ ජේසුන් වහන්සේගෙ ගෝලයන් සමීපව ඇසුරු කිරීමේ වරමින් ඔහු ඵල ලබාගත් හැටි මෙහි අපූරුවට විස්තර කැරේ. සැබෑ ක්‍රිස්තුන් වහන්සේ හඳුනා ගැනීම මගින් සිදුවන ජීවිත වෙනස ඔස්සේ ඔහු සත්‍යය සොයා ජීවිතයම පරදුවට තබා ක්‍රියා කරන අන්දම විටෙක කියවන්නාගේ සිත තුළ බිය ජනිත කරයි. එහෙත් ඒ සියල්ල දේව පුත්‍රයාණන් තුළින් ලැබෙන අපූරු වරම් ලෙස කතුවරයා ඉදිරිපත් කරන අන්දම සුවිශේෂී වටිනාකමින් යුක්තය.

1988 දී කතෝලික ප්‍රකාශන කේන්ද්‍රයෙන් ප්‍රකාශයට පත්වූ මේ ග්‍රන්ථය කාලයක් ගතවී ඇති නිසා නූතන පරපුරට රස විඳීමට අවස්ථාවක් ලබාදීම ඉතා වැදගත් යැයි මට හැඟේ.

**ශිරාන් මෛත්‍රී**

**ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...**

ඔබ පාසලේ, මිසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරීමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**"පොත් පත්"**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08



**සැන්දෑව**
**විශ්මි නවෝද්‍යා**
04 ශ්‍රේණිය
ක්‍රිස්තුරාජ දහම් පාසල - හිගුරක්ගොඩ



**වෙල් යායක්**
**එවාන් ප්‍රනාන්දු**
08 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල - කිඹුලාපිටිය

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**දිය ඇල්ලක්**
**ශයාන් රවිදු**
04 ශ්‍රේණිය
සා. ලාසරස් දහම් පාසල
උතුවන් කන්ද



**පරිසරයේ සුන්දරත්වය**
**නිශාන් අතපත්තු**
05 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
චීනවරාය - ත්‍රිකුණාමලය



**ළමා අපිත් ජේසුට ආදරය කරමු.**
**තෙන්මි වංචලා**
04 ශ්‍රේණිය
ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර්
දහම් පාසල - කැකිරාව



**දිය නාන මිනිසුන්**
**සොහාන් අරවින්ද**
07 ශ්‍රේණිය
ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර්
දහම් පාසල - උල්හිටියාව



**අපේ ගෙවත්ත**
**නිසන්යා දිහිනි ප්‍රනාන්දු**
06 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - දුනකදෙණිය



**දිනයක ඇරඹුම**
**විකාෂ් මාලින්ද ප්‍රනාන්දු**
05 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - හාල්දඬුවන



ගණාදුරින් වැසි ගිය නීල නෙතු දැහැන
ලෝකමත් විශ්වාසයෙන් තිර කර .......
විටෙක වළා ටැඹකි , තවත් මොහොතක සැඩ සුළඟකි.....
දෙවිඳුනි, ඔබ අප ළඟ සිටියා සෙවනැලි මවා
ඡායාවක් සේ.....
පිපාසයට දිය දෝතක් , කුසගින්නට දී අහරක් තුටින්
පිනෙව්වේ කවුරුද ඔබ මිසක .......
රුදුරු පාරාවෝ හඹා පසුපසින් ලුහු බඳින විට දෙපළු
කෙරුවා රත්ත සයුර ප්‍රාකාරයක් සේ .....
නොමග ගිය අපට දුන්නා ඔබ, අමයුරු පනත් තුනක් ඔබේ
පිදුම උදෙසා සොයුරු පෙමින් සියලු සැම තුටින් මත්
කිරිමට දුන්නා ඔබ අපට හත්පණක් විෂඝෝර රුදුරු වන
සතුන් හඹා පසුපස ලුහු බඳින විට දිරිය දුන්නේ ඔබමයි.
නැගිට යළි සිටගන්නට හිම පියලි වටුවන් මන්නා තිත්ත
දිය නැවුම් කර
රැක්කා ඔබ පෙරඹර නැගඑන
දිනිසුරු විලසින් ......
අන්ධකාරයට ආලෝකය වන්නා සේ......

**ශාලුක මධුරංග ඕබ්‍රිස්**
12 ශ්‍රේණිය (කලා)
ශාන්ත ඇන්ඩෲ මධ්‍ය මහ විද්‍යාලය - පුත්තලම

**මා හද පවිටු බවින් තැවෙයි**
**දවසින් දවස මා දෙවිඳුන් වෙතට ඇදෙයි**
**දෙවිඳුන්ට ළං වෙනවාත් සමඟම**
**සුළං රොදකට අසුවූ පුළුන් රොදක් සේ මට සැහැල්ලුවක් දැනේ**
**පවිටු මා හට කමා කළ මැන සමිඳේ!**

**මිරන්ත අශේන් රැඳිගු**
6 ශ්‍රේණිය
ශාන්ත ජෝශප් විදුහල (මීගමුව ශාඛාව )

යා යුතු මඟ කිමදැයි මා නොදනිමි සමිඳේ
ඒ මඟ ඔබ දන්නා බව මම අදහමි සමිඳේ
අඳුරේ ගැවසෙන මාගේ මේ ජීවිත මං පෙතේ
ආලෝකය විහිදන පහන් ටැඹ නුඹයි මම අදහමි සමිඳේ
මුව පොව්වකු සේ මිරිඟුව පසුපස දිව ගිය මේ ගමනේ
ජීවන ජලධාරාවක් විය නුඹ මට මම අදහමි සමිඳේ
ලෝකය පසු පස සතුට සොයා යන මේ ජීවිත සසරේ
එකම සතුට ඔබ පමණක් වන බව මම අදහමි සමිඳේ

**ශිරෝනි ප්‍රබෝධිකා පෙරේරා**
(අ.පො.ස . සා/පෙළ - 2011)
සා. සෙබස්තියන් බාලිකා මහ විදුහල - කඳාන

ලෝ දනා පාපී බැමින් වෙලී
නපුරාගේ වහලුන්ව සිටිද්දී
පව් බැමින් අප මිදුමට
ගැලවීම අපට දෙනු වස්
එද ගවලෙනේ මනුසත් බව ගෙන
උපන් සමිඳේ....
ලෞකීකත්වයෙන් මන්මත් ව
පාපී නපුරා සොයා
දැන හෝ නොදැන ගිය ගමන
වළකාලීමට
කල්වාරියේ දිව්පිදුයේ ඔබයි
සමිඳේ........
පාපි අපගේ පව්වලට සමාව
දුන්නේ ඔබේ හදපිරි ආදරයයි
කල්වාරි කඳු මුදුනේ සිරි රුධිරය
හෙලා,
අනේක අප්‍රමාණ වද වේදනා
වින්දේ
ඔබේ නොසිඳී ගලනා ආදරය
නිසයි.
මගේ සෙවනැල්ල බඳුව,
නිරතුරු මා හා රැඳෙන්න ආදර
සමිඳුනේ.

**එරන්දි තරුෂිකා සඳරේණු**
10 ශ්‍රේණිය
ක්‍රිස්තුරාජ විදුහල , වැලිවේරිය




වීණාවේ තත් පිරිමදින අතරේ
ඔබේ හඬ මට ඇසුණා සමිඳේ
හිරු කිරණින් ලොව
එළිකළ වෙලාවේ
ඔබේ රුව මට පෙනුණා සමිඳේ
ගංගාවේ දිය බිඳු අතරින්
ඔබේ සිසිලස මට දැනුනා සමිඳේ
නපුරා මා සොයමින්
පැමිණුන විටදි
නිරතුරු මා රැකගත් සමිඳේ
එබැවින් සමිඳේ මා හට
දෙනු මැන
ඉන්නට ඔබ තුරුලේ රැඳිලා
යන්න නොදෙනු මැන මා හට
ඔබ තුරුලෙන් වෙන්වීලා

**නීෂා මදුරංගි**
10 ශ්‍රේණිය
ජාකොමේ ගොන්සාල්වෙස්
දහම් පාසල
බෝලවත්ත



## සිසු නායක පදක්කම් පැළැඳවීම

### මීගමුව, උඩයාර්තෝප්පුව සා. ජෝශප් විද්‍යාලය



මීගමුව උඩයාර්තෝප්පුව සාන්ත ජෝශප් විද්‍යාලයේ ශිෂ්‍ය නායක නායිකා නිල ලාංඡන පැළඳවීමේ උත්සවය පසුගිය ද මීගමුව මීසම් සේවක ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

විදුහල්පතිනි පී. ගමගේ මහත්මියගෙ උපදෙස් මත නියෝජ්‍ය විදුහල්පතිනිය බී.ටී.එන්. පෙරේරා මහත්මිය ඇතුළු ගුරු මණ්ඩලය දෙමව්පියන්ගේ සහයෝගය ඇතිව උත්සවය සංවිධානය කර තිබුණි. විදුහල්පතිනිය හා නියෝජ්‍ය විදුහල්පතිනිය ශිෂ්‍ය නායක නායිකාවන් සමග පියතුමන් විද්‍යාලය වෙත කැඳවාගෙන එන අයුරු මෙහි දීස්වේ. **(රේමන් අපෝන්සු)**

---

### දැලතුර කණිෂ්ට ද්වීතියික විදුහල

දැලතුර කණිෂ්ට ද්වීතියික විදුහලේ සිසු දරුවන් 21 දෙනෙකුට ශිෂ්‍ය නායක පදක්කම් පැළඳවීම දැලතුර මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන් පදක්කම් පළඳවන අයුරු මෙහි දිස්වේ. විදුහල්පති ටෙරන්ස් රුදිගු මහතාද සිටි.

**(එස් .කේ. ජේ. කුරේරා)**



## ප්‍රහේලිකා අංක 30




( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

**හරහට**

1.''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ............................ කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන .......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර .................... පාවිච්චි කරන බව පවසමින් අමොස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාව කැඳවූයේ ඔහු කුඩා කාලයේදීමය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ............................ මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ .............................. . නරක් වන්නේස'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස ..................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම .................

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 5/4, 6/37, 6/20, 15/30 , ආමොස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)**


ඇය ඔටුව විකුණා ලබාගත් සල්ලි වලින් පාන් සහ පළතුරු ටිකකුත් ඇඳුමකුත් මිලදී ගත්තා. ඉතුරු සල්ලිත් රැගෙන කුඩා මේරි එයාගෙ ගෙදරට එන්න පිටත් වුනා.
2
සඳ කුමාරි
කතාව සහ චිත්‍ර... ඇස්. ඒ. පී. සමුආරච්චි
තවත් ටික දවසක් ගතවුනා... එයා ගෙනාපු පානුත් පළතුරුත් ඉවර වුනා..!
අනේ ඔටුව විකුණලා ගත්ත කෑමයි පළතුරුයි ඉවරයි.. අනේ තියෙන සල්ලි වලින් තව ටික දවසකට පාන ගන්න පුළුවං..
එයා අනේ තිබුන ඉතුරු සල්ලි වලින් තවත් ටික දවසක් ගතකළා. ඒ සල්ලිත් ඉවර වුනා...
දැන් මොකද කරන්නෙ ..සල්ලි.. ඔක්කොම ඉවරයි..
එයාට මතක් වුනා එයාගෙ මාම කෙනෙක් ඒ වවුමෙ ඉන්න බව..
හරි.. දවසක් අරේ අම්මයි.. තාත්තයි.. මාව එක්කගෙන ගියානෙ ඒ ගෙදරට මට හොඳට මතකයි ඒ ගෙදර..
යන්න ඕනි.. මාමව හම්බ වෙන්න.. වවුමෙ එයාගෙ ගෙදරට ඒ ගොල්ලො මාව පිළිගන්නී එකක් නෑ...
– පාලිත –

*ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි*

හය වන කොටස

# දිවැසිවර එලියා

සැකසුම : තිළිණ අලහකෝන්

